හිස්තැනට සුදුසු වචනය වරහන් තුලින් තෝරා ලියන්න

(ක්‍රියාකාරිත්වය, තත්‍යකාල , බහු පරිශීලක, පරිගණක ,දෘඩාංග )

1. මෙහෙයුම් පද්ධතිවල ............................................... අනුව ඒවා ඒකපරිශීලක, බහු පරිශීලක, බහු කාර්‍ය හා ................................................... ලෙස වර්ග කල හැකිය.
2. ......................................... මෙහෙයුම් පද්ධති එකවර පරිශීලකයින් බොහෝ ගණනකට පරිගණක යන්ත්‍රයක් වෙත පිවිස කටයුතු කිරීමට පහසුකම් සපයයි. එහි යන්ත්‍රවල ................................................ මෙහෙයුම් පද්ධති ස්ථාපනය කරනු ලබයි.
3. ....................................... මෙහෙයුම් පද්ධති යම් සුවිශේෂී ක්‍රියාවන් සඳහා විශේෂණය වී ඇත.

නිවැරදි පිළිතුර තෝරන්න

1. පරිගණකයක කළමණාකරණය , කාර්‍යය සම්බන්ධීකරණය සහ සම්පත් හවුලේ පරිහරණය යන ක්‍රියාවන්ට වගකිව යුත්තේ පහත සඳහන් ඒවා අතරෙන් කුමක්ද?
   I. යෙදුම් මෘදුකාංග
   II. මෙහෙයුම් පද්ධති
   III. පද්ධති උපයෝගීතා මෘදුකාංග (System Utilities)
   IV. චිත්‍රක පරිශීලක අතුරු මුහුණත් (GUIs)

2. පරිගණකයේදී කාර්‍යයන් සිදු කරනුයේ කුඩා කුඩා කාර්‍ය රාශියකට බෙදා ගනිමින් ය. මෙහෙයුම් පද්ධති වලදී මෙම කුඩා කාර්‍යයන් හඳුන්වන්නේ, .................................. ලෙසය.
   I. කළමණාකරණය
   II. ක්‍රියාවලියක්
   III. අනු කාර්‍යයක්
   IV. අනු ක්‍රියාවක්

3. දෘඪාංග පාලනය සඳහා අයත් නොවන කාර්යයක් වන්නේ,

    I. ක්‍රියාවලි සඳහා අවශ්‍යය මතකය වෙන් කර දීම
    II. ක්‍රියාවලි නියමිත පිළිවෙලකට ඉටු කිරීම
    III. ධාවක/ එලවුම් වැඩසටහන් ස්ථාපනය කිරීම
    IV. මිත්‍රශීලී පරිශීලක අතුරු මුහුණතක් ලබා දීම

4. ආරක්ෂක කළමණාකරණය යනු,

    I. ජාලකරණ නියමාවලි සඳහා සහය දීම
    II. අනිෂ්ට මෘදුකාංග හා අනවසර ඇතුලු වන්නන්ගෙන් ඇතිවන තර්ජන වලින් පරිගණක පද්ධතිය ආරක්ෂා කිරීම
    III. විධිමත්ව ගොනු හා ෆෝල්ඩර සම්බන්ධව කටයුතු කිරීම
    IV. වෛරස ආරක්ෂණ මෘදුකාංග ස්ථාපනය කිරීම

5. පහත ඒවායෙන් කුමක් මෙහෙයුම් පද්ධතියක මූලික කාර්යය වේද?

    A. – පරිශීලක ගිණුම් කළමණාකරණය
    B. - පරිගණකයේ මතක කළමණාකරණය
    C. – ලේඛනයක අක්ෂර වින්‍යාසය පරීක්ෂා කිරීම

    I. A පමණි
    II. A සහ B පමණි
    III. B පමණි
    IV. B සහ C පමණි